# 02 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

**හැඳින්වීම**

පෘතුගීසීන් ආසියාවට පැමිණි ආකාරයත් පෘතුගීසීන් හා ලන්දේසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවාගෙන සිටි ආකාරයත් පිළිබඳ ව දහවන ශ්‍රේණියේ දී ඔබට ඉගෙනීමට ලැබුණි. මෙම ජාතීන් දෙකට පසු ව ලංකාව කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කළ යුරෝපා ජාතිය බ්‍රිතාන්‍යයන් වේ. ඉංග්‍රීසි භාෂාව කතා කළ ඔවුහු පොදුවේ ඉංග්‍රීසීන් ලෙස ද හඳුන්වති. බ්‍රිතාන්‍යයන් මෙරට බලය පිහිටුවා ගැනීම හා 19 වන සියවසේ මුල් භාගය තුළ ඔවුන්ට එරෙහි ව පැවති සටන් පිළිබඳ ව මෙම පාඩමෙන් විස්තර කෙරේ.

## 2.1 බ්‍රිතාන්‍යයන් ආසියාවට පැමිණීම

පෘතුගීසීන් හා ලන්දේසීන් ආසියාවේ වෙළෙඳ කටයුතුවලින් විශාල වශයෙන් ලාභ ලබන බව දුටු ඉංග්‍රීසිහු ද ආසියාව කෙරෙහි තම අවධානය යොමු කළහ. ඒ අනුව බ්‍රිතාන්‍යයේ පළමුවන එළිසබෙත් රැජිනගෙන් රාජකීය බලපත්‍රයක් මගින් ආසියාවේ වෙළෙඳ කටයුතු පවත්වාගෙන යාමට අවසර ලබාගෙන, ඉංග්‍රීසි ව්‍යාපාරිකයන් පිරිසක් විසින් වර්ෂ 1600 දෙසැම්බර් මස ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම පිහිටුවන ලදි. එම වෙළෙඳ සමාගමේ පළමුවන නැව් කණ්ඩායම සුමාත්‍රා දූපත් ප්‍රදේශයට ගොස් එහි වෙළෙඳ කටයුතු ආරම්භ කර ඇත. මීට පසු විලියම් හෝකින්ස් යටතේ තවත් නැව් කණ්ඩායමක් ඉන්දියාවට පැමිණ එවකට ඉන්දියාවේ මූගල් අධිරාජයා වූ ජහන්ගීර් සමග වෙළෙඳ කටයුතු පිළිබඳ ව සාකච්ඡා පැවැත්වී ය.

ඉංග්‍රීසිහු ආසියාවට පැමිණි මුල් කාලයේ අග්නිදිග ආසියාතික ප්‍රදේශ සමග තම වෙළෙඳ සබඳතා තර කර ගැනීමට උත්සාහ කළෝ ය.

17 වන සියවසේ මුල් දශක දෙක තුළ අග්නිදිග ආසියාවේ වෙළෙඳ බලය ගොඩනගා ගැනීමට පෘතුගීසීන් හා ලන්දේසීන් අතර ගැටුම් ඇති වී තිබුණි. මෙහි දී ඉංග්‍රීසීන් ඇතැම් අවස්ථාවල පෘතුගීසීන්ට එරෙහිව ලන්දේසීන් සමග සහයෝගයෙන් ක්‍රියා කර ඇත. මෙම දෙපක්ෂයේ පොදු හතුරා වූ පෘතුගීසීන්ට එරෙහි ව කටයුතු කිරීමට ලන්දේසීන් ඉංග්‍රීසින්ගේ සහය ලබා ගත්තත් අග්නිදිග ආසියාවේ කුළු බඩු බහුල ව වැවෙන දූපත්වල ඉංග්‍රීසි බලයක් ගොඩනැගෙනු දැකීම ලන්දේසීන්ගේ අපේක්ෂාව නො වී ය. මේ නිසා 1623 වර්ෂයේ දී කුළුබඩු දිවයින්වලට අයත් ඇම්බොයිනා දූපතේ බලකොටුවකට පහරදුන් ලන්දේසීහු එහි සිටි ඉංග්‍රීසීන් පිරිසක් ඝාතනය කළහ. ඊට එරෙහි ව ලන්දේසීන්ට ප්‍රතිප්‍රහාරයක් දීමට තරම්


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

එම ප්‍රදේශයේ ඉංග්‍රීසි බලය ශක්තිමත් නොවූ හෙයින් අග්නිදිග ආසියාතික ප්‍රදේශවලින් ඉංග්‍රීසීහු ඉවත් වූහ. අනතුරුව ඔවුන් ඉන්දියාව කෙරෙහි සිය පූර්ණ අවධානය යොමු කළ බව පෙනේ.

ඉංග්‍රීසීන් 1607 වර්ෂයේ සිට ඉන්දියාව සමග වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීමට උත්සාහ කළ නමුත් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට වසර දහයකට වැඩි කාලයක් ගත විය. ඉන්දියාවේ දී ඉංග්‍රීසීන් ඉතා උපායශීලී ව කටයුතු කළ නිසා 17 වන සියවසේ අග භාගය වන විට මදුරාසිය, බොම්බාය හා කල්කටාව ඇතුළු ප්‍රදේශ කිහිපයක වෙළෙඳ මධ්‍යස්ථාන ආරම්භ කිරීමට ඔවුහු සමත් වූහ. එහෙත් 1664 වර්ෂයේ සිට ප්‍රංශවරුන් ද ඉන්දියාවට පැමිණ පොන්ඩිචේරි, කරිකාල් හා චන්ද්‍රනගර් වැනි ස්ථානවල වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීමත් සමග ලන්දේසීන්ට අමතර ව ප්‍රංශවරුන් සමගත් වෙළෙඳ තරගයක නියළීමට ඉංග්‍රීසීන්ට සිදු විය. 18 වන ශතවර්ෂය වන විට ඉන්දියාවේ ස්වකීය බලය ගොඩනැගීම සම්බන්ධයෙන් ඉංග්‍රීසීන් හා ප්‍රංශවරුන් අතර දේශපාලන ගැටුමක් ඇරඹිණ.

## 2.2 ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීම


ඉංග්‍රීසීන් ඉන්දියාවට පැමිණ ශතවර්ෂයකට වැඩි කාලයක් ගත වන තෙක් ශ්‍රී ලංකාව කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු නොවූ බව පෙනේ. මේ කාලයේ දී ඉංග්‍රීසීන් ඉන්දියාවේ ශක්තිමත් බලයක් ගොඩනගාගෙන නොතිබීමත් පෘතුගීසීන් හා ඊට පසු ලන්දේසීන් දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශවල ශක්තිමත් බලකොටු පද්ධතියක් පවත්වාගෙන යැමත් ඊට හේතු විණැයි සැලකිය හැකි ය. එහෙත් 18 වන සියවසේ මුල් භාගයේ දී ඉන්දියාවේ මූගල් අධිරාජ්‍ය පරිහානියට යැමත් සමඟ එතෙක් වෙළෙඳාමෙන් පමණක් තෘප්තිමත් වූ ඉංග්‍රීසීහු ඉන්දියාවේ දේශපාලන බලය පැතිරවීම ඇරඹීමත් සමග ලංකාව කෙරෙහි ද ඔවුන්ගේ අවධානය යොමු විය. ඒ සඳහා ප්‍රධාන හේතු දෙකක් බලපෑ බව පෙනේ.

1. ශ්‍රී ලංකාවේ පිහිටීම
2. ශ්‍රී ලංකාවේ කුරුඳු ඇතුළු වටිනා වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම

ශ්‍රී ලංකාව ඉන්දියාව ආසන්නයේ පිහිටා තිබීමත්, බෙංගාල බොක්ක ඇතුළු ඉන්දියාව අවට මුහුදු කලාපයේ නාවික හා වෙළෙඳ කටයුතු පාලනයට ලංකාව හොඳ මධ්‍යස්ථානයක් වීමත් ඉංග්‍රීසීන්ට ඉතා වැදගත් විය. ඉංග්‍රීසීන් හා ප්‍රංශවරුන් අතර බෙංගාල බොක්ක ආශ්‍රිත ප්‍රදේශවල සටන් ඇති වූ අවස්ථාවල සතුරු ප්‍රහාර නිසා අබලන් වූ නැව් අලුත්වැඩියා කිරීමට සුදුසු වරායක අවශ්‍යතාව ඉංග්‍රීසීන්ට තදින් දැනුණි. මෙහි දී ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ අවධානය නිතැතින් ම යොමු විය. ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ සැලකිල්ල යොමු වීමට බලපෑ කරුණු කිහිපයක් මෙසේ ය.

- ත්‍රිකුණාමල වරාය බෙංගාල බොක්කට මුහණ ලා පිහිටා තිබීම
- ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසී නාවික බලය රැක ගැනීමට එම වරායේ පිහිටීම වැදගත් වීම
- ඊසාන දිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීමට ත්‍රිකුණාමල වරාය යොදා ගත හැකි වීම


නොමිලේ බෙදා හැරීම සඳහා ය.




**සිතියම 2.1 ශ්‍රී ලංකාවේ පිහිටීම හා ත්‍රිකුණාමල වරාය**

ඉන්දියාවේ ආරක්ෂාවට මෙන් ම ඉන්දියානු සාගරයේ නාවික කටයුතු මෙහෙයවීමටත් හොඳ මධ්‍යස්ථානයක් වූ ත්‍රිකුණාමල වරාය ප්‍රංශවරුන් අතට පත් වුවහොත් එය තමන්ට ඉතා අවාසිදායක බව ඉංග්‍රීසීහු දැන සිටියහ. මේ නිසා ලංකාවේ භූගෝලීය පිහිටීමේ වැදගත්කම හා ත්‍රිකුණාමල වරායේ විශේෂ වැදගත්කම ඉංග්‍රීසීන්ගේ අවධානය මෙරට කෙරෙහි යොමු වීමට තුඩු දුන් ප්‍රධාන හේතුවක් විය.

ශ්‍රී ලංකාව ඒ වන විටත් කුරුඳු ඇතුළු කුළුබඩුවලට ප්‍රසිද්ධ රටක් විය. යුරෝපීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් තිබූ ඉස්තරම් වර්ගයේ කුරුඳු මෙරට නිෂ්පාදනය කෙරන බවත් කුරුඳු වෙළෙඳාමෙන් ලන්දේසීන් විශාල ලාභයක් ලබන බවත් ඉංග්‍රීසීහු දැන සිටියහ. මේ නිසා කුරුඳු වෙළෙඳාමේ ඒකාධිකාරය තමන් අතට ගැනීමට ඉංග්‍රීසීන්ට අවශ්‍ය වී තිබුණි. කුරුඳුවලට අමතරව මෙරට ගම්මිරිස්, එනසාල්, කරාබු නැටි, මුතු, මැණික් හා ඇත් දත් ආදිය ද ඉහළ මිලකට අලෙවි කළ හැකි වෙළෙඳ ද්‍රව්‍ය විය. මෙබඳු කරුණු නිසා ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාවේ දේශපාලන බලය පිහිටුවීම කෙරෙහි යොමු වූ බව පෙනේ.

ක්‍රියාකාරකම

බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

- ශ්‍රී ලංකාවේ පිහිටීම
- කුරුඳු ඇතුළු වටිනා කුළුබඩු ලබාගත හැකි වීම

**ඉංග්‍රීසීන් හා උඩරට රාජ්‍ය අතර දූත සබඳතා**

පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට ලන්දේසින්ගේ සහය ලබා ගත් සෙයින් ම ලන්දේසීන් දිවයිනෙන් පලවා හැරීම සඳහා වෙනත් විදේශ ජාතියක සහාය ලබා ගැනීමට උඩරට රජවරු කල්පනා කළහ. මේ අනුව කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ඉන්දියාවේ සිටි ඉංග්‍රීසීන් වෙත මෙන් ම ප්‍රංශවරුන් වෙත ද දූතයන් යවන ලදි. ඉංග්‍රීසි දූතයන් උඩරටට පැමිණීමට පසුබිම සැකසුණේ එහි ප්‍රතිඵල වශයෙනි. ඉංග්‍රීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට පෙර ඔවුන්ගේ දූතයන් තිදෙනෙකු වරින් වර උඩරටට පැමිණ තිබේ.

- ❖ 1762 දී ජෝන් පයිබස් උඩරට ට පැමිණීම
- ❖ 1782 දී හියුබොයිඩ් උඩරට ට පැමිණීම
- ❖ 1795 දී රොබට් ඇන්ඩෲස් උඩරට ට පැමිණීම

ජෝන් පයිබස් උඩරටට පැමිණෙන විට කීර්ති ශ්‍රී රාජසිංහ රජු උඩරට පාලකයා විය. සෙසු ඉංග්‍රීසි දූත ගමන් දෙක සිදු වූයේ රාජාධිරාජසිංහ රජුගේ කාලයේ දී ය. ජෝන් පයිබස් හා හියුබොයිඩ්ගේ ගමන්වල දී ඉංග්‍රීසීන්ට අවශ්‍ය වූයේ ලංකාව සමග වෙළෙඳ සබඳතා ඇති කර ගැනීම යි. එම දූත ගමන් සිදු වූ කාලයේ ලන්දේසින් හා ඉංග්‍රීසීන් ගැටුම්වලින් වැළකී එකමුතු ව අවශ්‍ය අවස්ථාවල ත්‍රිකුණාමල වරාය භාවිත කිරීමට ද කටයුතු කළ අතර මේ නිසා ලන්දේසීන්ට එරෙහි ව උඩරටට ආධාර දීමට ඉංග්‍රීසීහු ඉදිරිපත් නොවූහ. තමන්ගේ දේශපාලන අරමුණ වූ ලන්දේසීන් පළවා හැරීමට සහාය නොලැබෙන ජාතියක් සමඟ වෙළෙඳ සබඳතා ඇති කර ගැනීමට උඩරට රජවරු උනන්දු නොවූහ. මේ නිසා මුල් දූත ගමන් දෙකෙන් සාර්ථක ප්‍රතිඵල නොලැබුණි.

1795 වර්ෂයේ අගෝස්තු මාසයේ ඉංග්‍රීසි හමුදාව ලන්දේසීන් සතුව තිබූ ත්‍රිකුණාමල වරාය අල්ලා ගැනීමෙන් පසුව රොබට් ඇන්ඩෲස් උඩරටට ගොස් රාජාධිරාජසිංහ රජු මුණ ගැසුණි. ලංකාවේ සෙසු ලන්දේසී බලකොටු ඉංග්‍රීසීන් යටතට ගැනීමට සටන් සිදු වන

විට උඩරට රජුගේ සහාය ඉංග්‍රීසීන්ට ලබා ගැනීම ගැන සාකච්ඡා කිරීම ඇන්ඩෲන්ගේ දූත ගමනේ මූලික අරමුණ විය. එහි දී ඉංග්‍රීසීන්ට ආධාර ලබා දීමට රජු එකඟ විය. එහෙත් ලන්දේසීන් සමග මෙරට දී සිදු කළ සටන තමන් අපේක්ෂා කළ තරම් දුෂ්කර නොවන බව ලන්දේසි බලකොටු යටත් කිරීමෙන් ඉංග්‍රීසීන්ට පැහැදිලි විය. මේ නිසා දිවයිනේ ලන්දේසීන් සතු ප්‍රදේශ අත්පත් කර ගැනීමෙන් තමන් ලබන වාසිය උඩරට රජු සමඟ බෙදා හදා ගැනීමට ඉංග්‍රීසීන් තුළ කැමැත්තක් නොතිබුණි. එහි ප්‍රතිඵල වශයෙන් උඩරට රජුගේ කොන්දේසි පිළිගෙන රජු සමඟ දිගු කාලීන මිත්‍රත්වයක් ඇති කර ගැනීමට අවශ්‍ය සාකච්ඡා පැවැත්වීමට ඉංග්‍රීසිහු ඉදිරිපත් නොවූහ.

**ක්‍රියාකාරකම 1**

**1. ඉංග්‍රීසීන්ගේ උඩරට දූත ගමන් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.**

| වර්ෂය | දූතයාගේ නම | ගමනේ අරමුණ | ප්‍රතිඵලය |
|---|---|---|---|
| | | | |

## 2.3 බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් කර ගැනීමේ දී කැපී පෙනෙන අවස්ථා තුනක් හඳුනාගත හැකි ය.

- ❖ 1796 වර්ෂයේ දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවීම
- ❖ 1802 වර්ෂයේ දී එතෙක් ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යටතේ පාලනය වූ මෙරට මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් කිරීම
- ❖ 1815 වර්ෂයේ දී උඩරට රාජධානිය ඉංග්‍රීසීන් යටත් කර ගැනීම

**ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම**

1789 වර්ෂයේ දී ප්‍රංශ විප්ලවය ඇති වීමෙන් පසු ව යුරෝපයේ උද්ගත වූ නව දේශපාලන වාතාවරණය යුරෝපීයයන්ගේ ආසියාතික යටත් විජිත කටයුතු කෙරෙහි ද බලපෑවේ ය. විප්ලවයෙන් පසු ව ප්‍රංශයේ බිහි වූ නව ආණ්ඩුවේ හමුදාවෝ 1794 වර්ෂයේ දී

ඕලන්දය ආක්‍රමණය කළහ. මෙහි දී ඕලන්දයේ පාලකයා හෙවත් ස්ටැට්හෝල්ඩර්වරයා වූ පස්වන විලියම් රජු බ්‍රිතාන්‍යයට පලා ගියේ ය. ලන්දේසීන්ගේ රට වූ ඕලන්දය ප්‍රංශ බලයට යටත් විය. මේ නිසා ලන්දේසීන් යටතේ පැවති මෙරට මුහුදුබඩ ප්‍රදේශ ප්‍රංශවරුන් යටතට පත් වීමේ අවදානමක් මතු විය. ශ්‍රී ලංකාවේ වැදගත්කම ගැන මනා අවබෝධයකින් පසු වූ ඉංග්‍රීසීහු මෙම අවස්ථාව දිවයිනේ තම බලය පිහිටුවීමට යොදා ගත්හ. ප්‍රංශ ආක්‍රමණය නිසා ඕලන්ද පාලකයා වූ ස්ටැට්හෝල්ඩ්වරයා බ්‍රිතාන්‍යයේ රැකවරණ ලබා සිටි හෙයින් තමන්ට වාසිදායක ලිපියක් ඔහු ලවා මෙරට ලන්දේසි ආණ්ඩුකාරවරයා වෙත එවීමට ඉංග්‍රීසීන් කටයුතු සැලැස්වී ය.

ස්ටැට්හෝල්ඩ්වරයා එංගලන්තයේ කිව් මාලිගයේ සිට එවූ බැවින් එය **කිව් ලිපිය** වශයෙන් ද හැඳින්වේ. ලංකාවේ ලන්දේසීන් සතු ප්‍රදේශ ප්‍රංශවරුන් අතට පත් වීම වලක්වා ගැනීම පිණිස එම ප්‍රදේශවලට ඉංග්‍රීසි හමුදාව ඇතුළු කර ගත යුතු යැයි එම ලිපියේ සඳහන් විය. 1795 වර්ෂයේ පෙබරවාරි මස මෙරට ලන්දේසි ආණ්ඩුකාර ෆන් එංගල්බෙක් වෙත එකී ලිපිය ලැබුණි. එහෙත් ලිපියේ සඳහන් පරිදි තම බලකොටු තුළට ඉංග්‍රීසි හමුදාව ඇතුළු කර ගැනීමට මෙම ලන්දේසි ආණ්ඩුකාරවරයා මැලි විය. මේ නිසා 1795 අගෝස්තු මාසයේ දී ඉංග්‍රීසින් විසින් ලන්දේසින් සතු වූ ත්‍රිකුණාමලයට පහර දෙන ලදි. ඉංග්‍රීසි ප්‍රහාර හමුවේ ලන්දේසීහු කොන්දේසි විරහිත ව යටත් වූහ.



රූපය 2.1 ඕලන්ද පාලක පස්වන විලියම්



රූපය 2.2 එංගලන්තයේ කිව් මාලිගාව



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ත්‍රිකුණාමලය ඉංග්‍රීසින් අතට පත් වීමෙන් පසු ව එවකට ලන්දේසීන් සතු ව තිබූ මඩකලපුව, මුලතිව්, පේදුරුතුඩුව, යාපනය, මන්නාරම ඇතුළු බලකොටු රැසක් ම කෙටි කාලයකින් ඉංග්‍රීසීන්ට යටත් විය. 1796 පෙබරවාරි මාසය වන විට කොළඹ හා ගාල්ල බලකොටු ද ඉංග්‍රීසීන්ට යටත් වූ හෙයින් ලංකාවේ ලන්දේසීන් සතු ප්‍රදේශ සියල්ල ඉංග්‍රීසීන් යටතට පත් විය. ලන්දේසීන්ට තව දුරටත් අලාභ නොලබා සාධාරණ කොන්දේසි මත සාමකාමී ව මෙරටින් ඉවත් ව යාමට මග සැලසෙන ගිවිසුමක් පෙබරවාරි 16 දින අත්සන් කෙරුණි. මේ සමඟ ලන්දේසීන් සතු වූ මෙරට මුහුදුබඩ පළාත් ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා සමාගමේ පාලනයට නතු විය.

### ඉංග්‍රීසි වෙළෙඳ සමාගම යටතේ මුහුදුබඩ ප්‍රදේශවල පාලනය

පෘතුගීසීන් හා ලන්දේසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ කාලයේ පරිපාලන කටයුතු සඳහා හැකි තරම් ස්වදේශීය නිලධාරීන් යොදා ගෙන පරිපාලන කටයුතු සංවිධානය කර තිබුණි. එහෙත් ඉංග්‍රීසි වෙළෙඳ සමාගමට ඒ පිළිබඳ අවබෝධයක් නොතිබුණි. මේ නිසා ඉංග්‍රීසීහු තමන් යටතට පත් වූ ප්‍රදේශ ඉන්දියාවේ මදුරාසි පාලනය යටතේ මදුරාසියෙන් ගෙන්වූ නිලධාරීන් යොදා ගෙන පාලනය කළහ. 1796 වර්ෂයේ සිට 1798 දක්වා එම පාලනය පැවතුණි.

මදුරාසි පාලනය යටතේ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට රෙසිඩන්ට්වරයෙකු පත් කෙරිණි. ඔහු යටතේ ආදායම් එකතු කිරීමේ සහකාර පරීක්ෂකවරුන් පිරිසක් පත් කළ අතර ඔවුහු කලෙක්ටර්ස්වරුන් ලෙස හැඳින්වූහ. කලෙක්ටර්ස්වරුන්ගේ සේවා මධ්‍යස්ථානය කච්චේරිය ලෙස නම් කෙරිණ. මෙරට කච්චේරි ක්‍රමයේ ආරම්භය සිදු වූයේ එසේ ය. කලෙක්ටර්ස්වරුන්ට සහාය සඳහා තවත් නිලධාරීන් පිරිසක් පත් කර සිටි අතර ඔවුන් අවුමිල්දර්වරුන් ලෙස හඳුන්වා ඇත. අවුමිල්දර්වරුන්ගේ සහායට ද තවත් නිලධාරීන් පත් කර සිටි අතර මෙම සියලු නිලධාරීහු කලෙක්ටර්වරුන්ගේ අධීක්ෂණය යටතේ ආදායම් එකතු කිරීමේ කටයුතුවල නිරත වූහ.

ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ පාලනය යටතේ මුදලිවරුන් වැනි ස්වදේශීය නිලධාරීන් නොසලකා හැර තිබුණි. ඉහත කී අලුත් තනතුරුවලට අවශ්‍ය පිරිස මදුරාසියෙන් මෙරටට ගෙන්වා ගත් අතර එසේ පැමිණි නිලධාරීන්ට මෙරට සම්ප්‍රදායන්, සංස්කෘතිය හෝ ස්වදේශීය භාෂාවන් පිළිබඳ අවබෝධයක් නොතිබුණි. එබඳු නිලධාරි පිරිසකට සිවිල් පරිපාලනය, අධිකරණ කටයුතු හා ආදායම් ඉපයීමේ කටයුතු පවරා තිබීම නිසා පාලන අධිකාරිය හා මහජනතාව අතර සබඳතාව දුරස් විය.

දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ තමන් යටතට ගැනීමට කටයුතු කිරීමේ දී ඉංග්‍රීසි වෙළෙඳ සමාගමට විශාල මුදලක් වැය වී තිබුණි. එකී මුදල් ඉක්මනින් පියවා ගැනීමට හා හැකි තරම් ලාභ ලබා ගැනීමේ අරමුණෙන් පාලන කටයුතු මෙහෙයවීම මෙම පාලනයේ තවත් කැපී පෙනෙන ලක්ෂණයකි. මේ නිසා සමාගම විසින් මුහුදුබඩ ප්‍රදේශවලට අලුත් බදු වර්ග රැසක් පනවන ලදි. එම බදු මුදල්වලින් ගෙවීමට සිදු වීමෙන් මහජනතාව අපහසුතාවට ලක් ව තිබුණි. අලුතෙන් හඳුන්වාදුන් පොල්ගස් බද්ද එයට උදාහරණයකි. මේ අනුව පොල් ගස් දහයකට වැඩි ඉඩම්වලින් එක් පොල්ගසක් වෙනුවෙන් රිදී පනමක් බැගින් බදු ගෙවීමට

නියම කෙරිණ. පොල් ගසෙන් ලැබෙන ඵලදාවේ ප්‍රමාණය නොසලකා බදු අය කිරීමත් එම බදු මුදලෙන් ගෙවීමට නියම කිරීමත් ගැන වෙරළබඩ ප්‍රදේශවල නොසන්සුන්තාවක් ඇති විය. නව පාලනය කෙරේ පැවති මහජන අප්‍රසාදය නිසා කෙටි කාලයකින් ම එය කැරැල්ලක් බවට පත් විය. වර්ෂ 1797 දී ඉංග්‍රීසි වෙළෙඳ සමාගමට එරෙහිව ඇති වූ එම කැරැල්ල මුහුදුබඩ ප්‍රදේශ රැසක පැතුරුණි. මහත් වෙහෙසක් ගෙන ඉංග්‍රීසීන් විසින් කැරැල්ල මැඩ පවත්වන ලදි. මෙරට බ්‍රිතාන්‍ය පාලනය ආරම්භයේ දී ම මහජනතාවගේ විරෝධයක් පවතින බව මෙම කැරැල්ලෙන් පැහැදිලි විය. මේ නිසා මුහුදුබඩ ප්‍රදේශවල තත්ත්වය සොයා බලා අවශ්‍ය ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීමට කොමිසමක් පත් කෙරිණ. බ්‍රිගේඩියර් ජෙනරාල් දි මියුරන්ගේ සභාපතිත්වයෙන් පත් කළ එකී කොමිසම මියුරන් කොමිසම ලෙස හැඳින්වේ.

මියුරන් කොමිසමේ නිර්දේශ කිහිපයක්,

- ❖ බදු එකතු කිරීමට යොදවා සිටි මදුරාසි නිලධාරින් ආපසු යවා ඒ සඳහා දේශීය නිලධාරින් යොදවා ගැනීම
- ❖ පොල් ගස් බද්ද ඇතුළු අලුත් බදු වර්ග ඉවත් කිරීම
- ❖ ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙන ම නිලධාරින් පත් කිරීම
- ❖ ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම

1798 වර්ෂයේ ඔක්තොම්බර් මාසයේ සිට මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසි පාලනයේ කිසියම් වෙනසක් ඇති විය. ඒ අනුව දේශපාලන කටයුතු මෙහෙයවීම සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ආණ්ඩුකාරවරයෙකු පත් කරන ලදි. ඒ යටතේ ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා දිවයිනට පැමිණුණි. මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමේ දී ඉංග්‍රීසි වෙළෙඳ සමාගමට වැය වූ මුදල් පියවා ගැනීම සඳහා ආදායම් එකතු කර ගැනීම තව දුරටත් වෙළෙඳ සමාගම යටතට පත් කෙරිණ.


දේශපාලන කටයුතු බ්‍රිතාන්‍ය ආණ්ඩුව මගින් හා ආර්ථික කටයුතු වෙළෙඳ සමාගම මගින් ගෙන ගිය මෙම පාලන ක්‍රමය ද්විත්ව පාලනය වශයෙන් හැඳින්වේ. 1798 වර්ෂයේ සිට 1802 දක්වා එම පාලන ක්‍රමය පැවතුණි. ද්විත්ව පාලනය යටතේ ආණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය කිරීටයට වගකිව යුතු වූ අතර වෙළෙඳ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ද පිළිපැදිය යුතු විය. නෝර්ත් ආණ්ඩුකාරවරයාට වෙළෙඳ සමාගමේ මෙරට නිලධාරින්ගෙන් ද හොඳ සහායක් නොලැබුණි. ද්විත්ව පාලනයේ පැවති මෙබඳු අසාර්ථකවීම් නිසා 1802 වර්ෂයේ දී එම ක්‍රමය අවසන් කොට මෙරට මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් කෙරිණි. එතැන් සිට බ්‍රිතාන්‍යයන් සතු මෙරට ප්‍රදේශවල පාලන කටයුතු මුළුමනින් ම බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට පත් විය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**ක්‍රියාකාරකම**

1. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගැනීම යන මාතෘකාව යටතේ කෙටි ප්‍රශ්න සහ පිළිතුරු සකස් කරන්න.

## ඉංග්‍රීසීන් උඩරට රාජධානිය යටත් කිරීම



රූපය 2.3 - ස්වාභාවික ආරක්ෂිත ස්ථානයක් වූ මහනුවර නගරය

1798 වර්ෂයේ දී රාජාධිරාජසිංහ රජුගේ අභාවය සිදු වන විට උඩරට සිංහාසනයට උරුමකම් තිබූ නායක්කර් කුමාරවරුන් දෙදෙනෙකු සිටිබව පෙනේ. එක් අයෙක් කන්නසාමි නම් වූ අතර අනෙක් තැනැත්තා මුත්තුසාමි විය. එවකට උඩරට රාජ්‍යයේ මහාධිකාරම් වූ පිළිමතලව්වේගේ වැඩපිළිවෙළක් අනුව කන්නසාමි කුමරා ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජ කමට පත් කෙරිණි. මුත්තුසාමි කුමරා ආරක්ෂාව පතා ඉංග්‍රීසීන් වෙතට පළා ගියේ ය.



රූපය 2.4 ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

ඉංග්‍රීසීහු මෙරට මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටු වීමෙන් පසුව වැඩි කල් නොගොස් උඩරට රාජ්‍ය කෙරෙහි ද තම අවධානය යොමු කළහ. පෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ ප්‍රතිපත්තිය මෙහි දී විශේෂයෙන් කැපී පෙනේ. නෝර්ත් ආණ්ඩුකාරවරයා මුල් කාලයේ දී තමන්ට වාසි දයක ගිවිසුමකට උඩරට රජු එකඟ කරවා ගැනීමට උත්සාහ කළේ ය. ඒ අනුව 1800 වර්ෂයේ මාර්තු මස සෙන්පති මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් උඩරට ට දූත පිරිසක් යැවීමට නෝර්ත් කටයුතු යෙදී ය. හමුද හටයන් 1164ක් හා කාල තුවක්කු 8ක් ද සහිත මෙම දූත ගමනේ අරමුණ වූයේ ඉංග්‍රීසීන්ගේ යුද්ධ ශක්තිය පෙන්වා තමන්ට වාසි දයක ගිවිසුමකට රජු කැමති කරවා ගැනීම ය. එහෙත් විශාල හමුදවක් උඩරටට ඇතුළු කර ගැනීම මෙන් ම කාල තුවක්කු රැගෙන ඒමටත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් අවසර නොලැබුණි. මේ නිසා හමුදවෙන් විශාල පිරිසක් කාලතුවක්කු සමග අතරමග නවතා දූත පිරිසකට පමණක් රජු හමු වීමට සිදු විය. මැක්ඩෝවල් උඩරටට ගොස් රජු හා ප්‍රභූ පිරිස සමග සාකච්ඡා පැවැත්වූවත් ඉංග්‍රීසීන්ගේ කොන්දේසි පිළිගැනීමට රජු කිසිසේත් කැමති නොවී ය. එම දූත ගමනෙන් කිසිදු සාර්ථක ප්‍රතිඵලයක් නොලැබුණි.

උඩරට රජු තමන්ට අවනත කරගත නොහැකි වීම ගැන නෝර්ත් කනස්සල්ලෙන් පසු විය. උඩරට ස්වාධීන රාජ්‍යයක් පැවතීම මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසි පාලනයට බාධාවක් ලෙස සැලකිණ. මේ නිසා වෙරළබඩ ප්‍රදේශ ආරක්ෂා කිරීමට හමුද යෙදවීමට අමතරව අභ්‍යන්තර දේශ සීමා ආරක්ෂාවට ද තම හමුද යෙදවිය යුතු වූ හෙයින් විශාල වියදමක් දැරීමට ඉංග්‍රීසීන්ට සිදු විය. මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් පවා උඩරට රජු තම රජු ලෙස සැලකීමත් එම ප්‍රදේශවල කැරලි ඇති වූ විට උඩරට රජු කැරලිකරුවන්ට ආධාර දීමත් ඉංග්‍රීසීන්ට පැවති තවත් ගැටලුවකි. උඩරට රාජ්‍ය කිසියම් විටෙක තම සතුරන් වූ ප්‍රංශ ජාතීන්ගෙන් ආධාර ඉල්ලා සිටියහොත් එය තම පාලනයට තර්ජනයක් වන බව ද ඉංග්‍රීසීහු දැන සිටියහ. එසේ ම කොළඹ පාලන මධ්‍යස්ථානයේ සිට තම ප්‍රධාන නාවික මධ්‍යස්ථානය වූ ත්‍රිකුණාමලය සමග ගොඩබිමෙන් සබඳතා පැවැත්වීමටත් ඉංග්‍රීසීන්ට අවශ්‍ය විය. මෙම ස්ථාන දෙක අතර ගොඩබිම් සබඳතා පැවැත්වීමේ දී උඩරට රාජ්‍යයේ බල ප්‍රදේශය හරහා ගමන් කළ යුතු ව තිබුණි. මේ සඳහා මාර්ගයක් ඉදි කර ගැනීමටත් ඉංග්‍රීසීන්ට අවශ්‍ය විය. මෙබඳු කරුණු නිසා උඩරට රාජ්‍ය තමන්ට අවනත කර ගැනීම හෝ යටත් කර ගැනීම කෙරෙහි ඉංග්‍රීසීහු අවධානය යොමු කළහ.

**1803 උඩරට ආක්‍රමණය**

මැක්ඩෝවල්ගේ දූත ගමනෙන් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබුණු පසු නෝර්ත් ආණ්ඩුකරු උඩරට ආක්‍රමණට කිරීමට තීරණය කළේ ය. ඒ අනුව 1803 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවල කොළඹ හා ත්‍රිකුණාමලයේ සිට හමුද කණ්ඩායම් දෙකක් උඩරටට



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

යැවීමට නෝර්ත් කටයුතු යෙදී ය. මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් කෙරුණු මෙම ආක්‍රමණයේ දී පෙබරවාරි 21 දින ඉංග්‍රීසි හමුදාවෝ මහනුවර නගරයට ඇතුළු වූහ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා නගර වැසියෝ ආරක්ෂක උපායක් වශයෙන් නගරය අතහැර ගොස් සංවිධානය වන්නට වූහ. ඉංග්‍රීසීන් විසින් උඩරටට කැඳවාගෙන ගොස් සිටි මුත්තුසාමි කුමරා රජු හැටියට ප්‍රකාශයට පත්කරන ලදී. එහෙත් මුත්තුසාමිට කිසිදු සහායක් ලබා නොදුන් උඩරැටියෝ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු වටා එකතු වෙමින් සටනට සූදානම් වූහ.

වැසි සමය ආරම්භ වීමත්, ඉංග්‍රීසි හමුදාව අතර ලෙඩ රෝග පැතිර යාමත් පහතරට සිට උඩරටට තිබූ සැපයුම් මාර්ග උඩරැටියන් අවහිර කර තිබීමත් නිසා ආහාරපාන හිඟ වීමෙන් හා කොළඹ සමග පණිවිඩ හුවමාරුව දුෂ්කර වීමෙන් ඉංග්‍රීසීහු අනපේක්ෂිත තත්ත්වයට මුහුණ දුන්හ. මේ අතර කල් යල් බලමින් උඩරැටියන් එල්ල කළ ප්‍රහාර නිසා ඉංග්‍රීසි හමුදාවට මහත් පරාජයක් අත්විය. තම රූකඩ පාලකයා වූ මුත්තුසාමි කුමරා උඩරැටියන්ට පාවාදීමට සිදු වීමෙන් ඉංග්‍රීසීන් ලැබූ පරාජයේ තරම පැහැදිලි වේ.

මෙම ආක්‍රමණයට පෙර නෝර්ත් ආණ්ඩුකාරවරයාට උඩරට පිළිබඳ ව නිවැරදි අවබෝධයක් නොතිබිණි. එහෙත් තම ආක්‍රමණය පරාජයෙන් කෙළවර වීමත් සමග උඩරට රාජ්‍ය ශක්තිමත් බවත් මෙබඳු ආක්‍රමණවලින් එය ජය ගත නොහැකි බවත් නෝර්ත් ආණ්ඩුකාරවරයාට පැහැදිලි විය. මේ නිසා 1803 ආක්‍රමණයෙන් පසුව උඩරට සම්බන්ධයෙන් ඉතා උපායශීලී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට ඉංග්‍රීසීන් පෙළඹුණි.

### 1815 උඩරට ආක්‍රමණය

1805 වර්ෂයේ දී නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ පාලන කාලය නිම වීමෙන් පසු තෝමස් මෙට්ලන්ඩ් මෙරට ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වශයෙන් පත් විය. නෝර්ත් මෙන් උඩරට ආක්‍රමණය කිරීමට නොගිය හෙතෙම අනාගත ආක්‍රමණයකට අවශ්‍ය පසුබිම ගොඩනැගීමේ උපායශීලී ප්‍රතිපත්තියක් දියත් කළේ ය. ඒ සඳහා ඔහු ජෝන් ඩොයිලි නම් කාර්ය ශූර සිවිල් සේවකයා යොදා ගත්තේ ය.

**ජෝන් ඩොයිලි**

ජෝන් ඩොයිලි කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකි. ලංකාවට පැමිණි ඔහු සෙසු අය මෙන් දේශීය සංස්කෘතිය හෙලා නොදැක එය අවබෝධ කර ගැනීමට උගත්තේ ය. ඔහු කොරතොට ධම්මාරාම, මොරතොට ධම්මක්කන්ද යන හිමිවරුන් යටතේ ශාස්ත්‍රීය කටයුතුවල නියැළුණේ ය. ඩොයිලි ගජමන් නෝනා සමග ද තරගයට කවි ලිවීමට පවා සමත් වූ බවට ජනප්‍රවාද ගත තොරතුරු තිබේ. දේශීය සිරිත් විරිත් පිළිබඳ මනා දැනුමක් තිබූ ඩොයිලි බුලත් සැපයීමට පවා පුරුදු විය. මේ නිසා ජනතාව අතර පමණක් නොව උඩරට රදළ ප්‍රධානීන්ගේ ද ප්‍රසාදය දිනා ගැනීමට හෙතෙම සමත් විය. තම හැකියාවලින් ප්‍රයෝජන ගත් ඩොයිලි තීක්ෂණ බුද්ධියකින් යුතුව තමාට පැවරුණු රාජකාරි සේවය සාර්ථකව නිම කළේ ය.



රූපය 2.6 ජෝන් ඩොයිලි උඩරට ප්‍රභූන් සමග

ජෝන් ඩොයිලි උඩරට රදල ප්‍රභූන් සමග රහසිගත සබඳතා පවත්වා ගනිමින් ඔවුන් ඉංග්‍රීසීන්ට පක්ෂපාතී කර ගැනීමට කැප වීමෙන් කටයුතු කළේ ය. එසේ ම වෙළෙන්දන් සාස්තරකරුවන් වැනි විවිධ වෙස්ගත් චරපුරුෂයන් උඩරට ට යවමින් රාජධානියේ අභ්‍යන්තර කටයුතු ගැන සියලු තොරතුරු රැස් කිරීමට ඔහු කටයුතු කර ඇත. මේ නිසා උඩරට රාජධානියේ අභ්‍යන්තර ආරක්ෂක කටයුතු පිළිබඳ වෙනත් කිසිදු යුරෝපීයෙකු නොදත් තොරතුරු රැසක් අනාවරණය කර ගැනීමට ඩොයිලිට හැකියාව ලැබුණි. මේට්ලන්ඩ් හා ඩොයිලි විසින් ගොඩනගන ලද වාසිදයක තත්ත්වය ප්‍රයෝජනයට ගෙන උඩරට යටත් කිරීමේ ඉදිරි පියවර තබන ලද්දේ මේට්ලන්ඩ්ට පසු ආණ්ඩුකාර තනතුරට පත්ව ආ රොබට් බ්‍රවුන්රිග් විසිනි.

උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් වීමට හේතු වූයේ ඉංග්‍රීසීන්ගේ උපායශීලී කටයුතු පමණක් නොවේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලයේ දී එම රාජධානියේ පරිහානිය ඉක්මන් කෙරෙන කරුණු රැසක් නිර්මාණය වී තිබුණි. අත්දැකීම් අඩු තරුණ අයෙකු වූ රජු නායක්කර් ඥාතීන්ගේ බසට අවනත වී තීරණ ගැනීමට පෙළඹුණු බව පෙනේ. උඩරට අවසාන මහාධිකාරම්වරුන් දෙදෙනා ම රජු සමග මත භේද ඇති කර ගෙන තිබුණි. රජු බලයට පත් කළ පිළිමතලව්වේ මහාධිකාරම් හා රජු අතර ගැටුම් ඇති වී එහි ප්‍රතිඵල වශයෙන් මහාධිකාරම් මරණීය දණ්ඩනයට ලක් කෙරුණි. අනතුරුව එම තනතුරට පත් වූ ඇහැලේපොල අධිකාරම් හා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අතර ද ගැටුමක් නිර්මාණය විය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලයේ දී උඩරට ප්‍රභූ පන්තිය තුළ භේද උත්සන්න විය. මේ නිසා බහුතර රදල පිරිසක් රජුට එරෙහිව කටයුතු කරන තත්ත්වයක් පැවතුණි. මීට පෙර යුරෝපීයන් උඩරට ආක්‍රමණය කළ අවස්ථාවල මහජනතාව සංවිධානය



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කරමින් රාජධානිය හා රජු රැක ගැනීමේ සටනේ නායකයන් ලෙස කටයුතු කළේ ද මෙකී රදළ පිරිස වේ.

රජුගේ පාලන කාලය තුළ භික්ෂු ඝාතන කිහිපයක් සිදුවීම නිසා භික්ෂූන් වහන්සේලා හා රජු අතර සබඳතාව ද ගිලිහී තිබුණි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අවසන් වසර කිහිපයේ ගනු ලැබූ ඇතැම් පියවර නිසා රජු හා මහජනතාව අතර සබඳතාව ද බිඳ වැටිණ. බෝගම්බර වැව පුළුල් කිරීම, පත්තිරිප්පුව ඉදි කිරීම හා මහනුවර නගරයේ නවීකරණ කටයුතු ආදියට රාජකාරී සේවය සඳහා පැමිණි සබරගමුව, සත් කෝරළය, සතර කෝරළය වැනි ප්‍රදේශවල ජනතාවට රාත්‍රී කාලයේ අගනුවර නවාතැන් ගැනීම රජු තහනම් කර තිබුණි. මේ නිසා එකී ප්‍රදේශවල ජනතාව මහත් අපහසුතාවලට මුහුණ දුන්හ.

රජුට එරෙහිව සබරගමුවේ කැරැල්ලක් ඇති වූ අවස්ථාවේ වැඩි අපහසුවකින් තොරව එය මර්දනය කළ හැකි වුවත් සියයකට වැඩි පිරිසක් කැරැල්ල අවසානයේ මැරුම් කෑහ. මෙම කැරැල්ලෙන් පසු ඇහැළේපොල අත් අඩංගුවට ගැනීමට නොහැකි වීම නිසා මහනුවර සිටි ඔහුගේ බිරිඳ හා දරුවන් රජුගේ අතින් අමානුෂික ලෙස ඝාතනය වූ බව ඉතිහාසයේ දැක්වේ. මනුෂ්‍යත්වයේ සීමා ඉක්මවූ මෙබඳු කටයුතු නිසා 1815 වර්ෂය වන විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා මහජනතාව අතර විශාල පරතරයක් නිර්මාණය වී තිබුණි.

යුරෝපීයන් උඩරට ආක්‍රමණය කළ සෑම අවස්ථාවක ම උඩරට ප්‍රභූ පන්තිය හා මහජනතාව දිවි හිමියෙන් රජු ආරක්ෂා කර ගැනීමට ඉදිරිපත් වූහ. උඩරට රාජධානිය ආරක්ෂා කළ එකී මිනිස් පවුර ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කටයුතු නිසා රජුට එරෙහි බලවේගයක් බවට පත් විය. මේ නිසා තම රාජධානිය තුළ ම රජු අනාරක්ෂිත තැනැත්තෙකු බවට පත් වූ අතර එය ඉංග්‍රීසීන්ට මහත් වාසියක් විය. මේ තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා 1815 වර්ෂයේ ජනවාරි මාසයේ උඩරට ආක්‍රමණය කළ විට සුපුරුදු පරිදි රජු ආරක්ෂා කර ගැනීමට උඩරැටියෝ ඉදිරිපත් නොවූහ. මෙම ආක්‍රමණය උඩරැටියන්ගේ යහපත වෙනුවෙන් සිදු කරන බවත් උඩරැටියන්ගේ සතුරා ඉංග්‍රීසීන් නොව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බවත් ඒත්තු ගැන්වෙන ප්‍රකාශන උඩරැටියන්ට නිකුත් කිරීමට ද බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා කටයුතු කර ඇත.

ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කරන විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මහනුවර නගරය අතහැර ආරක්ෂිත ස්ථානයකට ගොස් සැඟවී සිටියේ ය. මැද මහනුවර පිහිටි එකී ස්ථානය උඩරැටියන් විසින් ම වටලන ලදි. 1815 පෙබරවාරි 18 දින උඩරැටියෝ රජු හා බිසෝවරුන් අල්වා ඉංග්‍රීසීන්ට පාවා දුන්හ. මෙසේ රජු අත් අඩංගුවට ගැනීම නිසා වෙනත් කිසිදු යුරෝපීයෙකු උඩරට දී නොලත් ජයක් ලබා ගැනීමට ඉංග්‍රීසීහු සමත් වූහ. එහෙත් රජු අත්අඩංගුවට ගත් පමණින් උඩරට රාජධානිය යටත් විනැයි පිළිගැනීමට ඉංග්‍රීසීහු සතුටු නොවූහ. රජු අත් අඩංගුවට ගත හැකි වූයේ උඩරට රදළ ප්‍රධානීන් ඉංග්‍රීසීන්ට සහය දුන් බැවිනි. මේ නිසා එම පිරිස සමග ගිවිසුමක් අත්සන් කිරීමෙන් උඩරට යටත් වීම සම්පූර්ණ කර ගැනීමට ඉංග්‍රීසින් විසින් කටයුතු කරන ලදි.



රූපය 2.7 මැද මහනුවර පිහිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අත්අඩංගුවට ගත් ස්ථානයේ තනවා ඇති ස්මාරකය

## උඩරට ගිවිසුම - 1815 වර්ෂය

1815 වර්ෂයේ මාර්තු දෙවන දින මහනුවර රාජ සභා ගොඩනැගිල්ල හෙවත් මගුල් මඩුවේ දී ඉංග්‍රීසි ආණ්ඩුව වෙනුවෙන් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා හා උඩරට වැසියන් වෙනුවෙන් රදළ ප්‍රධානීන් අතර උඩරට රාජධානිය යටත්වීම සම්බන්ධයෙන් ගිවිසුමක් ඇති විය. එය උඩරට ගිවිසුම ලෙස හැඳින්වේ.



රූපය 2.8 - 1815 උඩරට ගිවිසුම අත්සන් කල අවස්ථාවේ දී බ්‍රිතාන්‍යය ධජය බිම හෙලා වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන් නැවත ශ්‍රී ලාංකික කොඩිය එසවීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

වර්ෂ 1815 මාර්තු දෙවන දින මගුල් මඩුවට රැස්ව සිටි පිරිසට ගිවිසුමේ වගන්ති කියවා තේරුම් කර දීමෙන් පසු කිසිවෙකු විසින් හෝ ගිවිසුම අත්සන් කිරීමටත් පෙර සිංහ කොඩිය පහතට හෙළා ඉංග්‍රීසි කොඩිය එසවූ අවස්ථාවේ වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන් ඉංග්‍රීසි කොඩිය බිම දමා සිංහ කොඩිය යළි එසවී යැයි මතයක් තිබේ. ඇතැම් වාර්තාවලින් පෙනෙන ආකාරයට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා හා සමහර රදල ප්‍රධානීන් ගිවිසුමට අත්සන් තබා ඇත්තේ මාර්තු 10 දින දී ය.

උඩරට ගිවිසුම යනු උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත් වූ බව නිල වශයෙන් පිළිගත් ඓතිහාසික වශයෙන් වැදගත් ලේඛනයකි. මෙම ගිවිසුමේ මුල් වගන්ති තුනෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට හා ඔහුගේ ඥාතීන්ට උඩරට සිංහාසනයට තිබූ සියලු අයිතිවාසිකම් අහෝසි කෙරිණ. හතරවන වගන්තියෙන් උඩරට රාජධානිය ඉංග්‍රීසි ආණ්ඩුවට යටත් වූ බව ප්‍රකාශ කෙරුණු අතර උඩරට සාම්ප්‍රදයික නිලධාරි පන්තියේ අයිතිවාසිකම් හා වරප්‍රසාද රැකෙන පරිදි ඉංග්‍රීසීන් එය පාලනය කරන බව දැක්වී ය. පස් වන වගන්තියෙන් බුද්ධ ශාසනය හා දේවාගම කඩ නොකොට පවත්වා ගනිමින් භික්ෂූන් වහන්සේලා විහාරස්ථාන හා දේවාල ආරක්ෂා කරන බවට පොරොන්දු විය. සෙසු වගන්තිවලින් උඩරට රාජධානියේ අධිකරණ කටයුතු පවත්වාගෙන යන ආකාරය විස්තර වේ.

උඩරට ගිවිසුම අත්සන් කිරීමත් සමග වසර දෙදහසකට වැඩි කාලයක් සුරක්ෂිතව පැවති මෙරට ස්වාධීනත්වය අහෝසි වී ලංකාව සම්පූර්ණයෙන් ම විදේශ ආධිපත්‍යයට යටත් රටක් බවට පත් විය. ගිවිසුමෙන් ලැබුණු බලය ප්‍රයෝජනයට ගත් ඉංග්‍රීසීහු උඩරට පළාත් පාලනය සඳහා ආණ්ඩුකාරවරයාගේ නියෝජිතයා වශයෙන් නේවාසික නිලධාරියෙකු ලෙස ජෝන් ඩොයිලි පත් කළහ. ඔහුගේ කාර්යාලය මහනුවර නගරයේ පිහිටුවා ඔහුගේ සහායට තවත් නිලධාරීන් පිරිසක් පත් කෙරිණ. බ්‍රිතාන්‍ය පාලනය යටතේ සේවය කිරීමට කැමති වූ රදලයන්ට ඉංග්‍රීසි ආණ්ඩුව විසින් තනතුරු ප්‍රධානය කරන ලදි. මේ අනුව ශතවර්ෂ තුනකට වැඩි කාලයක් ස්වාධීන පාලනයකට හුරු වී සිටි උඩරට ජනතාවට විදේශීය පාලකයන් පිරිසක් විසින් මෙහෙයවන ලද පාලන ක්‍රමයක් යටතේ ජීවත් වීමට සිදු විය.

**ක්‍රියාකාරකම**

1. පහත මාතෘකා ඇසුරින් කෙටි ප්‍රශ්න පොතක් සකස් කරන්න.

- බ්‍රිතාන්‍යයන් ආසියාවට පැමිණීමේ පසුබිම
- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීම
- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

## 2.4 විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්

1815 වර්ෂයේ දී ඉංග්‍රීසීන් උඩරටට පැමිණීම නිසා ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ දරදඬු පාලනයෙන් උඩරටියන් මිදුණු නමුත් අනතුරුව ඇති වූ පාලන ක්‍රමය පිළිබඳව ඔවුන් තුළ ප්‍රසාදයක් නොතිබුණි. ශතවර්ෂ තුනකට වැඩි කාලයක් පෘතුගීසීන් ලන්දේසී වැනි යුරෝපීය ආක්‍රමණිකයන්ට එරෙහිව ජීවිත පරිත්‍යාගයෙන් සටන් කරමින් රැක ගත් නිදහස දැන් තමන්ට අහිමි වී ඇති බව වැඩි කල් නොගොස් ම උඩරටියෝ තේරුම් ගත්හ. මේ නිසා 1818 සහ 1848 යන වසරවල උඩරටියෝ තමන්ට හුරු පුරුදු සටන් ක්‍රම යොදා ගනිමින් ඉංග්‍රීසි පාලනයට එරෙහිව නැගී සිටියහ. ඉංග්‍රීසීන් විසින් ආණ්ඩුවට එරෙහි කැරලි වශයෙන් හඳුන්වන ලද මෙම අරගල ස්වදේශිකයන්ගේ පැත්තෙන් බලන විට විදේශිකයන් උඩරටින් නෙරපා හැර අහිමි වූ නිදහස යළි දිනා ගැනීමට දැරූ උත්සාහයන් ලෙස සැලකිය හැකිය. එබැවින් ඒවා ඉංග්‍රීසි පාලනයට එරෙහිව පැන නැගුණු මුල් ම නිදහස් සටන් වේ. අපි දැන් 1818 වර්ෂයේ සටන පිළිබඳව සලකා බලමු.

### 1818 නිදහස් සටන

1817 වර්ෂයේ සැප්තැම්බර් මස සිට 1818 ඔක්තොම්බර් මාසය පමණ දක්වා උඩරට ප්‍රදේශවල පැවති ඉංග්‍රීසි ආණ්ඩු විරෝධී ආයුධ සන්නද්ධ නැගීසිටීම, 1818 නිදහස් සටන ලෙස හැඳින්වේ. උඩරට ඉංග්‍රීසි පාලනය ආරම්භ වී වසර තුනක් ගතවීමටත් පෙර ප්‍රභූ පන්තිය හා සාමාන්‍ය ජනතාව මෙබඳු සටනකට යොමු වූයේ ඉංග්‍රීසීන්ගේ පාලනය ගැන ඔවුන් තුළ දැඩි කලකිරීමක් පැවති බැවිණි. මේ අනුව 1818 සටනට උඩරටියන් පෙළඹවූ හේතු රැසක් පැවති බව පෙනේ.

### 1818 සටනට තුඩු දුන් හේතු

- **නිදහස අහිමිවීම හා රජෙකු නැතිවීම පිළිබඳ පසුතැවිල්ල**

පහතරට පෘතුගීසි හා ලන්දේසි පාලන පැවති සමයේ පවා තමන්ගේ ම පාලකයන් යටතේ නිදහස භුක්ති විඳි උඩරට ජනයා 1815න් පසුව තමන්ට හුරු වූ එකී පාලන ක්‍රමය අහිමි වීම ගැන දුක් වූවාට සැක නැත.

රාජධානිය යටත් වීමෙන් පසු බ්‍රිතාන්‍යයේ රජතුමා උඩරට ප්‍රදේශයේ ද රජු බව ප්‍රකාශ වුවත් එම රජු උඩරටියන් කිසි දිනෙක දැක තිබූ අයෙකු නොවේ. උඩරටියන්ට අවශ්‍ය වූයේ සැතපුම් දහස් ගණනක් ඈත රටක සිටින නොදුටු රජෙකු නොව තම අගනුවර වෙසෙන තමන්ගේ දුක් ගැනවිල්ලක් ඉදිරිපත් කොට සහනයක් ලබා ගත හැකි රජෙකි. මෙසේ තමන්ට පෙනෙන ස්ථානයක රජෙකු නැති නිසා තමන් අරාජික යැයි උඩරටියන් තුළ හැඟීමක් පැවති බව පෙනේ. එකල උඩරට සිටි භික්ෂූන් වහන්සේ නමක් විසින් කියන ලදැයි සඳහන් පහත කවි දෙකෙන් රජ කෙනෙක් නැතිවීම නිසා පැවති කනස්සල්ල පැහැදිලි වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

අනේ කුහුඹිය නේ
තොපටත් රජෙක් ඉන් නේ
මොකදෑ කරන් නේ
අපේ කරුමේ අපට වන් නේ

රජෙක් ලැබුණොති න්
එදා කිරිබත් කන්න න්
පෙරහැර කරන්න න්
සාදු නාදෙන් ගිගුම් දෙන්න න්



රූපය 2.9 ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ සිංහාසනය

- **ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු වීම**

උඩරට ගිවිසුමේ 5 වන වගන්තියෙන් බුද්ධාගම ආරක්ෂා කරන බවට ඉංග්‍රීසීන් ප්‍රතිඥා දී තිබුණත් බුද්ධාගම ඇදහූ රජෙකුගෙන් ලැබෙන ආරක්ෂාව ම එම ආගම නොඇදහූ විදේශිකයන් පිරිසකගෙන් ආගමට ලැබෙනු ඇතැයි උඩරටියන් විශ්වාස නොකළ බව පෙනේ. ඉහත සඳහන් කවියේ රජෙක් ලැබුණෝතින් පෙරහැර කරන්නන්, සාදු නාදෙන් ගිගුම් දෙන්නන් ආදී වශයෙන් සඳහන් වීමෙන් මේ තත්ත්වය පැහැදිලි වේ. භික්ෂූන් වහන්සේලා සටනට සහාය දීම මෙයට තවත් උදාහරණයකි.

විදේශිකයන් යටතේ තම සම්ප්‍රදායන් හා සංස්කෘතිය විනාශ වෙතැයි ද උඩරටියන් තුළ බියක් පැවතිණ. සාම්ප්‍රදායික පාලනය යටතේ පෙර සිරිත ආරක්ෂා කිරීම රජෙකුගේ ප්‍රධාන යුතුකමක් විය. එසේ ම රජ මාලිගාව, රාජ සභාව හා පරිපාලන කටයුතු ආශ්‍රිතව සම්ප්‍රදායන් රැසක් පැවතුණි. පැරණි පාලනය යටතේ ඒ ඒ තනතුරුවලට නියමිත ඇඳුම් පැළඳුම් ආදිය භාවිත වූයේ ද ඒවායේ ගෞරවය සුරැකෙන පරිද්දෙනි. එහෙත් මහනුවර නගරයේ දක්නට ලැබුණු ඉංග්‍රීසි නිලධාරීන්ගේ හේවායෝ එම සංස්කෘතියට අනුගත වූ පිරිසක් නොවූහ. මේ නිසා ආගමික අංශයෙන් මෙන් ම සංස්කෘතික වශයෙන් ද ඉංග්‍රීසීන් හා උඩරටියන් අතර පරතරයක් නිර්මාණය වී තිබුණි. එය උඩරටියන් තුළ නිදහස පිළිබඳ හැඟීම් මතු කිරීමට හේතු විය.

- **උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම**

1815 ගිවිසුමට අනුව උඩරට සාම්ප්‍රදායික තනතුරු ඉංග්‍රීසීන් තව දුරටත් පවත්වාගෙන ගියත් රදලයන්ගේ බලය හා සමාජ තත්ත්වය සුරක්ෂිත නොවී ය. බ්‍රිතාන්‍ය සොල්දාදුවන් උඩරට දී තමන්ට ගරු සරු නොදක්වන බවට රදලයන් ඩොයිලිට පැමිණිලි කර තිබුණි. රදලයන්ගේ සාම්ප්‍රදායික ආදායම් මාර්ගවලට ද එම පාලනය නිසා පහර වැදුණි. ඉංග්‍රීසීන් කඩවත් බදු අහෝසි කිරීම නිසා රදලයන්ට එමගින් ලැබුණු ආදායම අහිමි වීම මීට උදාහරණයකි. රදලයන්ට පාරම්පරික ව හිමි වූ නිල තල වෙනස් කිරීමට ද ඉංග්‍රීසීන්ට හැකියාව ලැබුණි. උඩරට ප්‍රවාහන කටයුතු භාර වූ මඩිගේ මොහන්දිරම් තනතුරට මීට පෙර සැම විට ම සිංහල නිලධාරියෙකු පත් කිරීමේ සිරිතක් පැවතුණි. එහෙත් ඉංග්‍රීසීහු එම තත්ත්වය නොසලකා හජ්ජි මරික්කාර් නම් මුස්ලිම් ජාතිකයෙකු මොහන්දිරම් තනතුරට පත් කළහ. මේ නිසා ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ රදල ප්‍රධානීන් තුළ බලවත් කලකිරීමක් ඇති විය. මෙසේ විවිධ අන්දමින් රදල ප්‍රධානීන්ගේ වරප්‍රසාදවලට, තත්ත්වයට හා ආදායම් මාර්ගවලට පහර වැදීම නිසා ඔවුහු සටනට නායකත්වය දීමට ඉදිරිපත් වූහ.

**සටනේ ස්වභාවය**

ඉංග්‍රීසි පාලනය කෙරෙහි උඩරටියන් තුළ අප්‍රසාදයක් පවතින අතරතුර සිංහාසනයට උරුමයක් ඇතැයි කී දොරේසාමි නැමැත්තෙක් වෙල්ලස්ස ප්‍රදේශයෙන් මතු විය. කොහු කුඹුරේ රටේ රාළ වැනි ප්‍රාදේශීය ප්‍රභූවරුන්ගේ සහාය ඇතිව ඔහු රාජ්‍ය උරුමය ලබා ගැනීම සඳහා පිරිස් ඒකරාශි කරන බව බදුල්ල ඒජන්ත ඩග්ලස් විල්සන්ට දැන ගැනීමට ලැබුණි. මේ නිසා දොරේසාමි අත්අඩංගුවට ගැනීමට ඩග්ලස් විල්සන් විසින් හජ්ජි මුහන්දිරම් ඇතුළු පිරිසක් පිටත් කරන ලදි. එහෙත් සටන්කාමීන් අතින් ඔහු ජීවිතක්ෂයට පත් විය. අනතුරුව ඩග්ලස් විල්සන් ඒ සඳහා පිටත්ව ගිය නමුත් සටන්කරුවන්ගේ ඊ පහරකින් ඔහු ද මිය ගියේ ය. වෙල්ලස්ස ප්‍රදේශයේ ජනතාව දොරේසාමි වටා ඒකරාශි වන බව දුටු ආණ්ඩුව තත්ත්වය පාලනය කර ගැනීම සඳහා ඌව දිසාව භාර කැප්පෙටිපොළ වෙල්ලස්ස ප්‍රදේශයට පිටත් කර යැවී ය. එහෙත් කැප්පෙටිපොළ තමා සමග සිටි ඉංග්‍රීසි හමුදාව ආපසු යවා සටන්කාමීන්ට එකතු විය. මෙසේ කැප්පෙටිපොළ සටන මෙහෙයවීමට ඉදිරිපත් වීමත් සමග උඩරට රදලවරු බොහෝමයක් සටනට එකතු වූහ. උඩරට ප්‍රදේශ රැසක ම සටන ව්‍යාප්ත වීමට ද එය හේතුවක් විය. ප්‍රධාන පෙළේ රදලයන් අතුරින් සටනට එකතු නො වූයේ මොල්ලිගොඩ දිසාව හා එක්නැලිගොඩ පමණි.

කැප්පෙට්ටිපොළගේ මෙහෙයවීම මත සටන්කාමීන් විසින් දොරේසාමි උඩරට රජු ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. මේ අතර කැප්පෙට්ටිපොළ දිසාව නව රජුගේ මහාධිකාරම් තනතුරට පත් කෙරිණ. මෙරට රාජ්‍ය උරුමයේ සංකේතය වශයෙන් සැලකූ දළදාව සටන් කරුවන් අතට පත් වීම ඉංග්‍රීසීන් මුහුණ දුන් තවත් ගැටලුවකි. ඇහැලේපොළ සටනට එකතු නොවූවත් සටනට නායකත්වය දුන් රදලයන් හා ඔහු අතර සමීප ඥාති සබඳතා තිබූ බැවින් ඔහු ඉංග්‍රීසීන්ගේ සැකයට භාජන විය. මේ නිසා ඉංග්‍රීසීන් විසින් ඇහැලේපොළ අත් අඩංගුවට ගෙන කොළඹට රැගෙන එන ලදි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රූපය 2.10 කැප්පෙටිපොළ දිසාව

සටන මර්දනය කිරීමේ දී ඉංග්‍රීසීන් අනුගමනය කළේ ඉතා දරදඬු ප්‍රතිපත්තියකි. 1818 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී ආණ්ඩුකාරවරයා උඩරට ප්‍රදේශවලට යුද්ධ නීතිය ප්‍රකාශයට පත් කළේ ය. මුහුදුබඩ ප්‍රදේශවල සිටි ඉංග්‍රීසි හමුදාව පවා උඩරටට කැඳවිණ. සටන මර්දනයට ඉංග්‍රීසීන් අනුගමනය කළේ බිම් පාළු ප්‍රතිපත්තියකි. ගම්බිම් ගිනි තැබීම, වැසියන්ගේ සම්පත් විනාශ කිරීම හැකි තරම් පිරිසක් අත් අඩංගුවට ගෙන යුද්ධ නීතිය අනුව දඬුවම් කිරීම එකල සුලභ ලක්ෂණයක් විය. ඉංග්‍රීසීන්ගේ දැඩි මර්දනය හමුවේ දීර්ඝ කාලීන සටනක් ගෙන යාමට උඩරැටියන්ට හැකියාව නො ලැබුණි. මේ නිසා සටනේ නායකයන් රැසක් ම අත් අඩංගුවට ගැනීමට ඉංග්‍රීසීන්ට හැකියාව ලැබුණි. මත්තමගොඩ, කොබ්බෑකඩුව, දඹවින්න වැනි දිසාවන්වරු ද ගලගෙදර මොහොට්ටාල, කතරගම බස්නායක නිලමේ, බූටෑවේ රටේ රාළ, ඇහැලේපොළ අධිකාරම් වැනි නායකයන් ද එසේ අත් අඩංගුවට පත් වූවන් කිහිපදෙනෙකි.

සටනේ දී රජු ලෙස ඉදිරිපත් වූ තැනැත්තා නියම දොරේසාමි නොවන බවත් ඔහුට රාජ්‍ය උරුමයක් නොමැති බවත් හෙතෙම ව්‍යාජ පුද්ගලයෙකු බවත් ඉංග්‍රීසීහු ප්‍රචාරය කළහ. මේ සමග සටනේ ප්‍රධාන නායකයන් වූ කැප්පෙටිපොළ, මඩුගල්ල හා පිළිමතලාවෙ අතර මත භේද පවා ඇති විය. 1818 අගෝස්තු හා සැප්තැම්බර් මාස වන විට සටන බොහෝ දුරට අඩපණ වී තිබුණි. ඔක්තෝම්බර් මාසයේ දී කැප්පෙටිපොළ හා මඩුගල්ලේ අත් අඩංගුවට ගැනීමට ඉංග්‍රීසීහු සමත් වූහ. යුද්ධාධිකරණයට ඉදිරිපත් කළ එම නායකයන් දෙදෙනාට ම මරණ දඬුවම නියම විය. 1818 නොවැම්බර් 26 දින ඉංග්‍රීසීන් විසින් කැප්පෙටිපොළ හා මඩුගල්ලේ දෙදෙනා හිස ගසා මරණයට පත් කරන ලදි.

## 1818 සටන අසාර්ථක වීම හා එහි ප්‍රතිඵල

සටන ආරම්භ වී මුල් මාස කිහිපය තුළ එය ශීඝ්‍රයෙන් පැතුරුණි. එක් පෙදෙසක ගේ දෙර වතු පිටි විනාශ කොට ඉංග්‍රීසි හමුදව විසින් සටන්කරුවන් පලවා හරින ලද විට තවත් පෙදෙසකින් සටන ඇරඹුණි. එහෙත් ඉංග්‍රීසීන් අමතර හමුද කැඳවාගෙන දැඩි මර්දනයක් දියත් කිරීමත් සමඟ ම ඒකාබද්ධ සටනක් මෙහෙයවීමට උඩරැටියෝ අපොහොසත් වූහ. මොල්ලිගොඩ නිලමෙ ඉංග්‍රීසීන්ට හිතවත්ව කටයුතු කළ බැවින් ඔහුගේ පාලන ප්‍රදේශය වූ සතර කෝරලය හරහා කොළඹ සමඟ සබඳතා පවත්වා ගැනීමට හැකියාව ලැබීමත් ඉංග්‍රීසීන්ට වාසි දයක විය. මෙසේ බලන විට සටන අසාර්ථක වීමට බලපෑ හේතු රැසක් හඳුනාගත හැකි ය. එබඳු හේතු කිහිපයක් සංක්ෂිප්තව පහත දැක්වේ.

1818 සටන අසාර්ථක වීමට හේතු :

- ඉංග්‍රීසීන් අනුගමනය කළ දැඩි මර්දනශීලී ප්‍රතිපත්තිය
- දීර්ඝ කාලීන සටනකට අවශ්‍ය අවි ආයුධ හෝ වෙනත් සම්පත් උඩරැටියන්ට නොතිබීම.
- සටනේ අසංවිධානාත්මක ස්වරූපය.
- රජු හැටියට ඉදිරිපත් වූ තැනැත්තාට රාජ්‍ය උරුමයක් නැති බවත් හෙතෙම ව්‍යාජ පුද්ගලයෙකු බවත් හෙළි වීම.

1818 නිදහස් සටනේ ප්‍රතිඵල වශයෙන් ඇල්ලෙපොළ, කැප්පෙටිපොළ, මඩුගල්ලේ වැනි නායකයන්ට උඩරට රාජ්‍යයේ නිදහස වෙනුවෙන් දිවි පිදීමට සිදු විය. තවත් රදලයන් රැසකගේ දේපොළ රාජ සන්තක කෙරිණ. සටනට සහාය දුන් නායකයන් පිරිසක් රටෙන් පිටුවහල් කරන ලදි. ආණ්ඩුවට එරෙහිව කටයුතු කළ පිරිසට මෙසේ විවිධ දඬුවම් පැමිණුවූ අතර ඉංග්‍රීසීන්ට පක්ෂපාතව ක්‍රියා කළ මොල්ලිගොඩ, එක්නැලිගොඩ වැනි රදලයන්ට විවිධ වරප්‍රසාද ලබා දීමට කටයුතු කෙරිණ.

1818 සටන අසාර්ථක වීම නිසා ඉංග්‍රීසීන්ට තවදුරටත් උඩරට බලය ස්ථාවර කර ගැනීමට හැකියාව ලැබුණි. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් 1818 නොවැම්බර් 21 දින විශේෂ ප්‍රකාශනයක් නිකුත් කරමින් උඩරට තම බලය සවිමත් කිරීමට පියවර ගන්නා ලදි. වගන්ති 56කින් සමන්විත එකී දීර්ඝ ප්‍රකාශනයෙන් රදලයන්ගේ බලතල කප්පාදු කෙරිණ. එතෙක් රදලයන් සතු වූ අධිකරණ බලය සීමා කොට ඉංග්‍රීසීන්ගේ උසාවි ක්‍රමය උඩරට පිහිටුවීමටත් අවශ්‍ය පියවර ගැනිණි. මේ අනුව 1818 නොවැම්බර් ප්‍රකාශනයෙන් උඩරට ඉංග්‍රීසි බලය පිහිටුවීම සම්පූර්ණත්වයට පත් වූ බවක් පෙනේ.

## 1848 නිදහස් සටන

1818 සටන අසාර්ථක වීමෙන් පසු වසර තිහක් පමණ ගතවන විට ඉංග්‍රීසි ආණ්ඩුවට එරෙහිව නැවත වරක් සටනක් සිදු විය. උඩරැටියන්ට හුරු පුරුදු වූ පැරණි රාජාණ්ඩු ක්‍රමය යළි පිහිටුවා ගැනීමට දෙවන වරටත් උත්සාහ කළ මෙම සටන මෙරට



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඉංග්‍රීසි ආධිපත්‍යයට එරෙහිව ඇති වූ ආයුධ සන්නද්ධ දෙවන නිදහස් සටන ලෙස වුව ද හැඳින්විය හැකි ය. 1848 වර්ෂයේ දී සිදු වූ මෙම සටන ආරම්භ වීමට තුඩු දුන් හේතු රැසක් පවතී.

## සටනට තුඩු දුන් හේතු

1848 සටනට තුඩු දුන් හේතු කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම හා රජයේ නව බදු ප්‍රතිපත්තිය යන ප්‍රධාන කරුණු දෙකක් ඔස්සේ විග්‍රහ කළ හැකි ය.

## කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම

## රජයේ ඉඩම් ප්‍රතිපත්තිය

1833 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ අනුව රජය ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළේ ය. කෝපි වගාවට අවශ්‍ය සාරවත් ඉඩම් හා පරිසරය උඩරට ප්‍රදේශවල පැවති හෙයින් රජයේ ඉඩම් ප්‍රතිපත්තිය එම ප්‍රදේශවල සාමාන්‍ය ජනතාවට පීඩාකාරී විය. 1840 වර්ෂයේ පනවන ලද මුඩු ඉඩම් පනත අනුව වසර තිහක් නොකඩවා භුක්ති විඳි බවට පිළිගත හැකි, සාක්කි ඉදිරිපත් කළ නොහැකි වූ වගා නොකළ ඉඩම් රාජ සන්තක කෙරිණ. උඩරට වැසියන් පාරම්පරිකව භුක්ති විඳි බොහෝ ඉඩම්වල අයිතිය පෙන්වීමට නීත්‍යානුකූල ලියවිලි නොතිබුණි.

මේ නිසා ඔවුන්ගේ හේන් ඉඩම් ආදිය විශාල වශයෙන් රාජ සන්තක විය. රජය මෙම ඉඩම් ඉතා අඩු මුදලකට විදේශිකයන්ට ලබා දුණි. මෙසේ තමන්ගේ ඉඩම් අහිමි වීමත් කෘෂි කාර්මික කටයුතු අඩාළ වීමත් නිසා වැසියෝ රජය කෙරෙහි කලකිරුණහ.

## ගම් සභාව අඩපණ වීම

කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් අනිවාර්ය සේවා රාජකාරි ශ්‍රම ක්‍රමය අහෝසි කිරීම ගම් සභාවේ පැවැත්මට අහිතකර ලෙස බලපෑවේ ය. ඒ ඒ ප්‍රදේශවල වැව් අමුණු හා ඇළවේලි ඉදි කිරීම නඩත්තු කිරීම බොහෝ විට සිදු වූයේ ගම් සභාව මගිනි. ගම් සභාවට ශ්‍රමය ලැබුණු ප්‍රධාන ක්‍රමය රාජකාරී ශ්‍රම ක්‍රමය විය. එහෙත් රාජකාරි ශ්‍රම ක්‍රමය අහෝසි කිරීම නිසා ගම් සභාවට ශ්‍රමය ලබා ගැනීම දුෂ්කර විය. ග්‍රාමීය ප්‍රදේශවල සුළු ආරවුල් විසඳීමෙන් ගම් සභාවෙන් වැදගත් සේවයක් සැලසිණ. එහෙත් 1833 ප්‍රතිසංස්කරණ නිසා ගම් සභා සතු අධිකරණ බලය අහිමි විය. මෙබඳු කරුණු නිසා ගැමි ජනතාව පීඩාවට පත් විය.

## නව අධිකරණ ක්‍රමය

කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ අනුව ගැමියන්ගේ සුළු ආරවුලකට පවා උසාවි කරා යාමට සිදු විය. ඊට පෙර මෙබඳු ආරවුල් ගම් මට්ටමින් විසඳා ගැනීමට හැකියාව තිබුණි. නව උසාවිවල භාවිත කළ ඉංග්‍රීසි භාෂාව හෝ නීති රීති ගැන ගැමියන්ට අවබෝධයක් නොතිබුණි. මෙම උසාවි වල පිහිට පතා ගිය විට නීතිඥ ගාස්තු හා මුද්දර ගාස්තු ආදිය මුදලින් ගෙවීමට සිදු වීමත් දින ගණන් උසාවිවල කාලය ගත කිරීමට සිදු වීමත් ගැමියන් මුහුණ දුන් තවත් ගැටලු විය. මේ නිසා ඔවුන්ගේ හේන් ගොවිතැන් ආරක්ෂා කිරීම ඇතුළු කෘෂිකාර්මික කටයුතු පවා අතපසු විය.

## රජය හා මහජනතාව අතර සබඳතාව දුරස් වීම

කෝල්බෲක්ගේ නිර්දේශ අනුව සිවිල් සේවා තනතුරු සංඛ්‍යාව අඩු කිරීමත් සිවිල් සේවකයන්ට වතු වගා කටයුතුවල යෙදීමට අවසර ලබා දීමත් ප්‍රදේශීය පරිපාලන කටයුතු අකාර්යක්ෂම වීමට බලපෑවේ ය. මේ අනුව පරිපාලන නිලධාරියාගේ බල ප්‍රදේශය විශාල වූ හෙයින් ඔහුගේ අධීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීම දුෂ්කර විය. ඇතැම් නිලධාරීන් වගා කටයුතු ගැන උනන්දු වූ නිසා මහජන අවශ්‍යතා ගැන සොයා බැලීමට යෙදූ කාලය අඩු විය. මෙබඳු හේතු නිසා පොදු ජනතාවගේ ගැටලු රජයට නිසි ලෙස වාර්තා නොවූ අතර රජය හා මහජනතාව අතර සබඳතාව අඩපණ වීමට ද එය බලපෑවේ ය.

## රජයේ නව බදු ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූ ටොරින්ටන් සාමිවරයා විසින් 1848 දී අලුත් බදු වර්ග රැසක් පනවනු ලැබීම සටනට බලපෑ ආසන්න ම හේතුව විය. මේ වන විට රජයේ ආදායම් තත්ත්වය අඩු වී තිබූ හෙයින් සැලකිය යුතු මුදලක් මහජනතාවගෙන් එකතු කර ගැනීමේ අරමුණින් ආණ්ඩුකාරවරයා විසින් බදු ප්‍රතිසංස්කරණයක් ඇති කරන ලදි. මුද්දර බද්ද, කරත්ත හා ඔරු පාරු බද්ද, වෙළෙඳසැල් බද්ද, තුවක්කු බද්ද, ඇඟ බද්ද හා බලු බද්ද එකී නව බදු වර්ග වේ. මෙම බදු වර්ග සියල්ලට ම මහජන අප්‍රසාදයක් පැවති අතර, තුවක්කු බද්ද, ඇඟ බද්ද හා බලු බද්දට එරෙහිව විරෝධතා වඩාත් කැපී පෙනුණි.

ගැමි ජනතාව තුවක්කු භාවිත කළේ තම වගාවන් ආරක්ෂා කර ගැනීම පිණිස ය. අලුතෙන් පැන වූ තුවක්කු බද්ද අනුව වසරකට සිලිං දෙකහමාරක් ගෙවීමට සිදු විය. මේ නිසා ගැමියාට රජයේ කාර්යාලවලට යාමට සිදු වූ අතර ඒ සඳහා ගත වූ කාලයට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීමට තවත් අමතර මුදලක් ගෙවීමටත් සිදු විය. තුවක්කු වෙනුවෙන් වැය කළ මුදල ඒවායේ වටිනාකමටත් වැඩි අවස්ථා තිබුණි. මේ නිසා තුවක්කු බද්ද කෙරෙහි ජනතා විරෝධයක් පැවතුණි.

සෑම වැඩිහිටි පිරිමියෙකු ම වසරකට දින හයක් පාරවල් තැනීමේ කටයුතුවල යෙදිය යුතු වූ අතර එසේ නොකළ හොත් සිලිං තුනක ඇඟ බද්දක් ගෙවීමට නියම විය. මේ පිළිබඳ ව ද මහජන විරෝධයක් පැවතුණි. 1848 දී බල්ලන් වෙනුවෙන් ද බදු ගෙවීමට



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සිදු විය. මෙය ඉතාමත් අනුවණ බද්දක් වූ අතර එයට ප්‍රබල මහජන විරෝධයක් පැවතුණි.

නව බදු වර්ග රැසක් පැන වූ කාලයේ දී ම රජයේ නිල් පොත නම් සංඛ්‍යා ලේඛන සංග්‍රහය සඳහා ආණ්ඩුව විසින් තොරතුරු සමීක්ෂණයක් සිදු කරන ලදි. මෙය තවත් බදු පැනවීමේ සූදානමක් යැයි මහජනතාව අතර සැකයක් මතු විය.

## 1848 සටනේ ස්වභාවය

ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තියට විරෝධය දැක්වීමට මහජනතාව ඒකරාශී වීම තුළින් රජය හා රටවැසියා අතර ගැටුම් ආරම්භ විය. කොළඹ, ගාල්ල, මහනුවර, බදුල්ල වැනි නගරවල මෙම මහජන ඒකරාශිවීම් ඇති වූ අතර ඉංග්‍රීසි සිවිල් නිලධාරීන්ට එරෙහිව ඒවායේ දී විරෝධතාවක් මතු විය. බදුල්ලට රැස් වූ ඇතැම් ගොවීහු තුවක්කු බද්දට විරෝධය දැක්වීම පිණිස ඒජන්තවරයා ඉදිරියේ ම තම තුවක්කු පොළවේ ගසා කඩා දැමූහ. හාරදහසක පමණ ජනතාවක් නුවර කච්චේරිය අසලට රැස්ව බදුවලට විරෝධය දක්වා පෙළපාලි යාමට සූදානම් වූහ. පොලීසියට මෙම පිරිස පාලනය කිරීම දුෂ්කර වූයෙන් හමුදාව කැඳවීමට සිදු විය. කොළඹ හා මහනුවර ප්‍රදේශවලින් ආරම්භ වූ විරෝධතා මාතලේ, දඹුල්ල, වාරියපොළ, කුරුණෑගල වැනි ප්‍රදේශවලත් පැතිරුණි.

මාතලේ, වාරියපොළ, කුරුණෑගල වැනි ප්‍රදේශවල ජනතාව ආයුධ අතට ගෙන සංවිධානය වෙමින් රජයේ ගොඩනැගිලි හා උසාවි ආදියට පහර දීමටත් ඉදිරිපත් වූහ. රජයේ බදු ප්‍රතිපත්තියෙන් සාමාන්‍ය ජනතාව වඩාත් පීඩනයට පත්ව සිටි හෙයින් එම ජනතාව අතුරින් මතු වූ ගොන්ගාලෙගොඩ බණ්ඩා, පුරන් අප්පු, ඩිංගිරාළ, දිනෙස් වැනි නායකයෝ සටන් මෙහෙයවීමට ඉදිරිපත් වූහ. සටන්කාමීහු පිරිසක් දඹුලු විහාරයට රැස්ව එහි නායක ස්වාමීන්වහන්සේගේ සහාය ඇතිව ගොන්ගාලෙගොඩ බණ්ඩා රජු වශයෙන් අභිෂේක කළහ.

1848 සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ මාතලේ ප්‍රදේශය යි. ඊට අමතරව මහනුවර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශයන්හි ද ගැටුම් ව්‍යාප්ත විය. එහෙත් 1818 සටන මර්දනය කිරීම තුළින් අත්දැකීම් ලබා සිටි ඉංග්‍රීසීහු වහා ම මෙම සටන මැඩ පැවැත්වීමට පියවර ගත්හ. ටොරින්ටන් ආණ්ඩුකාරවරයා විසින් යුද්ධ හමුදාව යොදවා සටන්කාමීන්ට එක් රැස් වීමට ඉඩ නොතබමින් දියත් කළ මර්දනය නිසා සටන ඉක්මනින් ම බිඳ වැටිණ. මේ නිසා සටන ආරම්භ වී මාස දෙකක් ගත වන විට එහි නායකයන් බොහෝ දෙනෙක් අත් අඩංගුවට ගැනීමට ඉංග්‍රීසීහු සමත් වූහ. එසේ අත් අඩංගුවට පත් වූ ගොන්ගාලෙගොඩ බණ්ඩාට එරෙහිව නඩු අසා කස පහර දී ඔහු රටින් පිටුවහල් කෙරිණ. පුරන් අප්පුට මරණීය දණ්ඩනය නියම කෙරුණු අතර හෙතෙම එඩිතරව එම දඬුවමට මුහුණ දුන්නේ ය. සටනට සම්බන්ධ වූ තවත් පිරිසකට සිර දඬුවම් නියම කෙරිණි. මේ අතර ඉංග්‍රීසීන් විසින් අත් අඩංගුවට ගන්නා ලද කඩහපොළ හිමියන්ට එරෙහිව නඩු අසා වැඩි වග විභාගයකින් තොරව පසු දින ම වෙඩි තබා මරණයට පත් කිරීම ගැන ආණ්ඩුවට දැඩි අප්‍රසාදයක් එල්ල විය.

## සටන අසාර්ථක වීම

1818 සටන මෙන් මෙම සටන ද මනාව සංවිධානය වී නොතිබීම එහි අසාර්ථකත්වයට තුඩු දුන් කරුණකි. මෙම සටනට ඉදිරිපත් වූ බොහෝ දෙනෙකු සාමාන්‍ය ජනතාව වූ අතර ඔවුන්ට නිසි යුධ පුහුණුවක් හෝ අවශ්‍ය අවි ආයුධ නොතිබුණි. මේ වන විට උඩරට මාර්ග පිළිබඳව ඉංග්‍රීසීන්ට හොඳ අවබෝධයක් තිබූ අතර ඔවුන්ගේ හමුදා ශක්තිය උපක්‍රම හා ආයුධ බලයට එරෙහිව කටයුතු කිරීමට සටන්කරුවන්ට හැකියාවක් නොතිබුණි. මෙම සටන උඩරට ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වීම නිසා පහසුවෙන් ම එය මර්ධනය කිරීමට ඉංග්‍රීසීන්ට හැකියාව ලැබුණි.

1848 සටන සිදු වන විට මෙරට ආණ්ඩුකාරවරයා වූ ටොරින්ටන් සාමිවරයාගේ කටයුතු පිළිබඳ බොහෝ විවේචන එල්ල වූයෙන් මෙරට තත්ත්වය සොයා බැලීමට එංගලන්ත ආණ්ඩුව විසින් විශේෂ කමිටුවක් පත් කරන ලදි. ඒ අනුව ටොරින්ටන් ආණ්ඩුකාරවරයා ආපසු බ්‍රිතාන්‍යයට කැඳවිණ. මහජන විරෝධයට තුඩු දුන් බදු වර්ග ඉවත් කෙරිණි. ඒ අනුව වෙළෙඳසැල් බද්ද හා බලු බද්ද මුළුමනින් ම අවලංගු කෙරිණි. සෙසු බදු වර්ග සමාලෝචනය කොට ඒවායේ අහිතකර අංග ඉවත් කිරීමට ඉංග්‍රීසීහු පියවර ගත්හ. බුද්ධාගම සම්බන්ධයෙන් රජය එතෙක් කටයුතු කළ ආකාරය ගැන මෙරට අප්‍රසාදයක් පවතින බව තේරුම්ගෙන ඒ ගැන සැලකිලිමත් වීමට ද කටයුතු කෙරුණි. මෙරට ගොවි ජනතාවගේ ගැටලු විසඳීමට 1850ට පෙර රජයේ ප්‍රමුඛ අවධානයක් යොමු නොවූවත් පසුව එම ප්‍රතිපත්තියේ ද කිසියම් වෙනසක් ඇති වූ බව පෙනේ.

**ක්‍රියාකාරකම 1**

**1818 හා 1848 නිදහස් අරගල ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.**

| වර්ෂය | සටනට බලපෑ හේතු | සටනේ නායකයෝ | සටනේ ප්‍රතිඵල |
|---|---|---|---|
| | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.